**ශීර්ෂය 273 - පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

**-------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**----------------**

### 1.1 මතය

**-------**

පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පුත්තලම දිස්ත්‍රික් ලේකම් කර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි **31** දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජූලි 04 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

**----------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

**----------------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | නිරීක්ෂණය<br>වටිනාකම<br>රු. | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 109 ජේදය | 3,064,063 | 1989 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලය තුළ අලාභහානි සිදුවී වර්ෂ 01 සිට 30 ක කාලයක් ගතවී ඇතත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වාහන 19 ක් සඳහා කපා නොහල අලාභ හානිවල වටිනාකම අදාල වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට හෝ පොත්වලින් කපා හැරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | වර්ෂ ගණනාවකට පෙර සිදු වූ අලාභහානි සම්බන්ධව අදාල දත්ත සපයා ගැනීමේ දුෂ්කරතාවය මත කටයුතු අවසන් කිරීමට නොහැකිව ඇත. ඒ පිළිබඳව කටයුතු කිරීමට උත්සහ දරමින් සිටින බව කාරුණිකව දන්වමි. | රජයේ දේපල වලට සිදුවී ඇති අලාභහානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 109 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මෙහෙයුම් සමාලෝචනය

## 2.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පුත්තලම හා මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල 2021 වර්ෂයේ දී සැලසුම් කර තිබුණු රු.69,629,383 ක් වූ ව්‍යාපෘති 46 ක ප්‍රගතිය සියයට 20 - 25 ත් අතර, පරාසයක වූ අතර, ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් අතරමඟ නවතා දමා තිබුණි. | එකඟ වෙමි. | අවශ්‍ය ප්‍රතිපාදන ලබාගෙන සැලසුම් කල පරිදි ව්‍යාපෘති ඉටුකිරීමට කටයුතු කළයුතුය. |

**2.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| **(අ)** | වෙන්නප්පුව ජෝෂප්වාස් විද්‍යාලයේ ක්‍රීඩාගාරයේ වහලය සකස් කිරීමට 2014 වර්ෂයේ දී රු.48,638,504 ක් වැයකර තිබුණ ද, 2022 වර්ෂය වනවිට ද, ක්‍රීඩාගාරය ප්‍රතිලාභයක් නොලබා අසම්පූර්ණ ව්‍යාපෘතියක් ලෙස පවතින බව නිරීක්ෂණය විය. | රේඛීය අමාත්‍යාංශ යටතේ ප්‍රතිපාදන සැලසූ මෙම ව්‍යාපෘතිය සම්බන්ධ ශක්‍යතා අධ්‍යනය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සිදු කල යුතු අතර පුත්තලම දිස්ත්‍රික් ලේකම් විසින් සිදු කරන ලද්දේ ලබාගත් ඇස්තමේන්තුවට අනුකූලව ඉදිකිරීම් කටයුතු අධීක්ෂණය කිරීම පමණි. | ඉදිකිරීම ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |
| **(ආ)** | වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.1,467,477 ක් වැයකර 2021 වර්ෂයේ දී වගුරු බිමක් ගොඩකර ඉදිකර තිබුණු වයික්කාල එකමුතු වොලිබෝල් ක්‍රීඩාංගනය භූමිය තැනින් තැන පුපුරා ගොස් තිබූ අතර, විගණිත දිනවන 2022 පෙබරවාරි 07 දින වන විටත් නිශ්කාර්යව පැවතුණි. | ඉදිකිරීම් කටයුතු අධීක්ෂණය වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව විසින් සිදුකළ අතර ව්‍යාපෘතියේ අඩුපාඩු සම්පූර්ණ කරන ලෙස ප්‍රාදේශීය සභාවට දැනුම් දී ඇත. | ව්‍යාපෘතියේ පවතින අඩුපාඩු කඩිනමින් නිම කරවාගෙන ව්‍යාපෘතිය භාවිතා කළහැකි තත්ත්වයට ළඟා කර දීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය. |

2.3 අතහැර දැමූ ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අනුමත ප්‍රතිපාදන මුදල රු.990,000 ක් වූ මාර්ග දෙකක් වැඩිදියුණු කිරීම සඳහා ප්‍රජාමූල සංවිධාන සමඟ ගිවිසුම්ගත වී තිබුණ ද, ABC සඳහා ලබා දියයුතු Compaction Test වාර්තා ලබා නොදීම, ප්‍රමාණවත් කාලයක් නොමැති වීම මත ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. | එකඟ වෙමි. | ලැබෙන ප්‍රතිපාදනවලට අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කළයුතුය. |

## 2.4 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් හා ප්‍රසම්පාදන කාල සටහනක් සකස් කර නොතිබුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වැය ශීර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර තිබුණි. නමුත් එක් එක් වැඩසටහන් සඳහා කාලසටහන් සකස් කර නොතිබුණු අතර ඉදිරියේ දී එක් එක් වැඩසටහන් සඳහා කාලසටහන් සකස් කිරීමට අදාල අංශ වෙත උපදෙස් ලබා දී ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 4.2.1 හා 4.2.2 ප්‍රකාරව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සහ ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙල කළයුතුය. |
| (ආ) පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් කාබනික පොහොර නිෂ්පාදන ගොවීන්ට බෙදාදීමට අවශ්‍ය උපකරණ මිලට ගැනීම වෙනුවෙන් අවස්ථා 08 ක දී එකතුව රු.54,689,300 ක් වූ ප්‍රසම්පාදන 08 ක් සිදුකර තිබුණ ද, උපකරණ මිලදීගෙන නොතිබුණි. ඒ හේතුවෙන් ප්‍රසම්පාදන කාර්යයන් සඳහා වැයකල ශ්‍රමය සහ සම්පත් නිශ්කාර්ය වියදම් බවට පත්ව තිබුණි. | කාබනික පොහොර නිෂ්පාදන ගොවීන්ට උපකරණ ලබා දීම ඉතා අත්‍යවශ්‍ය කරුණක් බැවින් ඒ සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කළ ද, අදාල උපකරණ සියල්ලම ආනයනය කළ යුතු බව සැපයුම්කරුවන් විසින් පවසන ලදී. එය 2022 මාර්තු හෝ අප්‍රේල් විය හැකි බව ද වැඩිදුරටත් සඳහන් කරන ලදී. රටේ පවත්නා තත්ත්වය හේතු කොට ගෙන අදාල මිළදී ගැනීම් සිදු නොකරන ලදී. | ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීමේ දී අදාල කාර්ය නිවැරදිව සැලසුම් කර මිලදීගත හැකිනම් පමණක් ප්‍රසම්පාදන කටයුතු සිදු කළයුතුය. |

## 2.5 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු නිල නිවාස 05 ක් අවශ්‍යතාවය ඇති නිලධාරීන්ට ලබාදීමට කටයුතු කර නොතිබුණු අතර, භාවිතයට | දැනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතුව භාවිතයට සුදුසු නිල නිවාස 05ක් පොරොත්තු ලේඛනයේ සිටින නිලධාරීන්ට ලබා දීමට | නිල නිවාස උපරිම ප්‍රයෝජනය ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර භාවිතයට ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගතනොහැකි නිල නිවාස 06 ක් අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, නිල නිවාස 09 ක් වෙනත් ආයතන වෙත පවරා දී තිබුණි. | කටයුතු කළ ද එම නිවාස වල ඇති පැරණි තත්වය හා අඩුපාඩු නිසා ඔවුන් විසින් එම නිවාස භාර ගැනීමට අකමැති විය. ඔබ විසින් සඳහන් කරන ලද නිශ්කාර්යව පවතින නිල නිවාස 06 ඉතා පැරණි අබලන් තත්වයේ පවතින බැවින් එය අලුත්වැඩියා කිරීම සඳහා විශාල මුදලක් අවශ්‍ය වේ. එබැවින් අප වෙත වෙන් කරන ලද ප්‍රතිපාදන මගින් එය අලුත්වැඩියා කිරීමට ද නොහැක. | |
| (ආ) | පුත්තලම නගර සභාව විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් නිල නිවාසයක් පැවති අක්කර එකකට වැඩි ඉඩම ඇල්ෆා ගොඩනැගිල්ලේ රථවාහන නතර කිරීමේ කටයුතු සඳහා රථගාලක් ලෙස සංවර්ධනයක් කිරීමට ලබාදී තිබුණු අතර, එකඟතාවය පරිදි එම ඉඩමේ වටිනාකමට සමාන ඉඩමක් ලබාගැනීම් කටයුතු කර නොතිබුණි. | එම ඉඩම තක්සේරු කිරීමට කටයුතු කර ඇත. තවද, පුත්තලම නගර සභාව වෙත නගරයේ සංවර්ධනය සඳහා ලබා දෙන ලද නිල නිවාසය සඳහා වන ඉඩම හා නගර සභාව විසින් අප වෙත ලබා දීමට අදාල ඉඩම ද තක්සේරු කිරීමට තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. එසේම අදාල ඉඩමෙහි ඉදි කිරීමට අදාල නිල නිවස සඳහා ඇස්තමේන්තු අප විසින් සකස් කිරීමට කටයුතු කර ඇත. | ප්‍රමාදයකින් තොරව ඉඩම ලබාගෙන සැලසුම් කල පරිදි කටයුතු කළයුතුය. |
| (ඇ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් බවුසරය වර්ෂ ගණනාවක සිට භාවිතයකින් තොරව පරිසරයට නිරාවරණව තබා තිබීම හේතුවෙන් දිරාපත් වී ගර්හිත තත්ත්වයට පත්ව පැවතුණි. | අදහස් දක්වා නොමැත. | වත්කම් ආරක්ෂිතව ගාල්කර තිබිය යුතු අතර, භාවිතයට ගතනොහැකි වත්කම් විධිමත්ව අපහරණය කළයුතුය. |

## 2.6 රජයේ නිලධාරීන් ඇප තැබීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 880 හා 885 ප්‍රකාරව හා අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක 07/2019 හා 2019 මාර්තු 23 දිනැති දිස්ත්‍රික් පාලන චක්‍රලේඛනයේ 03 හා 05 වගන්ති ප්‍රකාරව ඇප තැබීමට නියමිත නිලධාරීන් මාස 03 ඇතුළත ඇප තබා නිමකල යුතු වුවත්, මාදම්පේ ප්‍රාදේශීය ලේකම් ඇතුළු නිලධාරීන් 07 ක් එපරිද්දෙන් ක්‍රියාකර නොතිබුණි. | අදාල චක්‍රලේඛය පරිදි ඇප තැබීම සඳහා අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති අතර මෙම වර්ෂය තුළ ඇප තැබිය යුතු සියලුම නිලධාරීන්ගේ ඇප ලබා ගැනීමට කටයුතු කරන බව දන්වමි. | නීති, රීති හා චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළයුතුය. |

## 2.7 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ඉදිකරමින් පැවති දිස්ත්‍රික් ලේකම් කාර්යාල ප්‍රධාන ගොඩනැගිල්ලේ 14 වන බිල්පත ගෙවීම් ප්‍රතික්ශේෂ කර තිබූ අතර, බේරුම් කරන ක්‍රියාවලියකට ගොස් 14 වන බිල්පත ගෙවීමට සිදුවීමෙන් ප්‍රමාද පොලී ලෙස රු.10,349,580 ක් ගෙවීමට සිදුවී තිබුණි.<br><br>(ආ) 2018 සැප්තැම්බර් 25 දින බේරුම් කරන වාර්තාව අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට කොන්ත්‍රාත් ගිවිසුමේ 15.4(9) අනුව ගිවිසුම් අවලංගු කර දින සිට ප්‍රමාද පොලී ගෙවීම් නොමැතිව ගෙවීම් වාර්තා රඳවාගත හැකියාව ඇති බව දක්වා තිබිය දී හා 2013 මාර්තු 19 දින කොන්ත්‍රාත්කරු ද ගිවිසුම් අවලංගු කරන බව දක්වා තිබිය දී ප්‍රමාද පොලී ගෙවීම් විගණනයට ගැටළු සහගත විය. | ගොඩනැගිල්ලේ තිබුණු පිපිරුම් හා ඉරි තැලීම් නිසා කොන්ත්‍රාත්කාර ආයතනය වෙත 14 වෙනි බිල්පත නොගෙවීමට කටයුතු කරන ලදී. නමුත් එම ආයතනය විසින් බේරුම් කිරීමේ මණ්ඩලය වෙත මෙම 14 වන බිල ගෙවීම සඳහා ගිය අතර එම මණඩලයේ තීරණය අනුව අප වෙත එම ආයතනය විසින් මුදල් ගෙවිය යුතු බව සඳහන් වීම හේතුවෙන් එම ආයතනය විසින් බේරුම්කරණ ක්‍රියාවලියට යොමු වන ලදී. බේරුම්කරණ මණ්ඩලයේ තීරණය අනුව මෙම ගෙවීම සිදු කරන ලදී. | 14 වන බිල්පත ගෙවීම ගිවිසුම් කොන්දේසි අනුව කළයුතුව තිබිය දී ඒ අනුව කටයුතු නොකිරීමෙන් පොලී ගෙවීමට සිදුවී තිබූ බැවින්, ඒ පිළිබඳ පරීක්ෂා කර වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ක්‍රියාමාර්ග ගතයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ව්‍යාපෘති 13 ක් නිමකර වර්ෂ 1 ත් - 5 ත් අතර, කාලයක් ගතවී තිබුණ ද, එකතුව රු.9,949,016 ක් වූ රැඳවුම් මුදල් නිදහස් කර නොතිබුණි. | දැනට නිදහස් කිරීමට කටයුතු කරමින් සිටින අතර අක් මුදල් ලැබීමේ ඇති ප්‍රමාදය මෙය නිදහස් නොකිරීමට හේතු වේ. | ගිවිසුම් පරිදි කටයුතු කර මුදල් නිදහස් කළයුතුය. |
| (ඈ) | ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බත්තුළුඔය, සෙංගල් ඔය සහ සුරුවිල යන ග්‍රාම නිලධාරී වසම්වල පවත්වාගෙන යන අනවසර ඉස්සන් ගොවිපලවල් 22 ක් සහ වර්තමානය වනවිට අක්‍රිය තත්ත්වයේ පවතින ගොවිපලවල් 04 ක් පිළිබඳව තොරතුරු වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට 2019 හා 2020 වර්ෂවලදී යොමු කර තිබුණ ද, එම අනවසර ඉස්සන් ගොවිපලවල් විගණිත දිනවන 2022 ජනවාරි 14 දින වන විටත්, නවතා දැමීමට කටයුතු කර නොතිබුණි. තවද, මෙම ඉස්සන් ගොවිපලවලින් බදු මුදලක් හෝ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විට මේ සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතී | කාර්යක්ෂමව ක්‍රියාමාර්ගගත යුතුය. |
| (ඉ) | ග්‍රාම ශක්ති පලමු සහ දෙවන අදියර යටතේ පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ග්‍රාම නිලධාරී වසම් 12 ට අයත් සමිති 12 ක් ලබාදී තිබූ මුදලින් රු.9,901,991 ක ශේෂයක් වූ අතර, විගණිත අවස්ථාව වනවිට සියලුම ග්‍රාම ශක්ති සමිති අක්‍රිය තත්ත්වයේ පැවතුණි. | ග්‍රාම ශක්ති සමිති ක්‍රියාත්මක කිරීමට උපදෙස් ලද පසු ක්‍රියාත්මක කරන බව දන්වමි. | ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටුවන පරිදි කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගතයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | මහවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව මඟින් ක්‍රියාත්මක කරවන ලද සපිරිගමක් සංවර්ධන ව්‍යාපෘති සඳහා මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ 2019 දෙසැම්බර් 06 දිනැති අංක 01/2019 නැමති සංවර්ධන චක්‍රලේඛයේ 11 වැනි වගන්තිය අනුව ව්‍යාපෘති නිශ්චිත වියයුතු අතර, මාර්ගයේ ආරම්භය හා අවසානය තිබිය යුතු වුවද, ඉටුකරන ලද ව්‍යාපෘති 16 ක එම තොරතුරු දැක්වීමට කටයුතු කර නොතිබුණි. | පෙන්වා දී ඇති පරිදි කටයුතු කිරීමට ප්‍රාදේශීය ලේකම් දැනුවත් කරන ලදී. | චක්‍රලේඛයට අනුව කටයුතු කළයුතුය. |
| (උ) | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2021 අගෝස්තු 26 දිනැති ලිපිය අනුව පල්ලම ඉබ්බන්වලයාය මොළඑළිය මංකඩ ආශ්‍රිත උස්සාන වාරි ව්‍යාපෘතිය හා තම්මන තුන්සරණගම උස්සාන වාරි ව්‍යාපෘතිය ඉදිකිරීම ඵලදායි කටයුත්තක් නොවන බව දක්වා තිබිය දී මෙම ව්‍යාපෘති දෙක වෙනුවෙන් රු.19,501,434 ක් වියදම් කිරීම විගණනයේ දී මතභේදයට තුඩුදෙන්නක් විය. තවද, ඇස්තමේන්තු කල මුදලට වඩා රු.6,702,299 ක් වැයකර තිබුණි. | මෙම ව්‍යාපෘති ආරම්භක අවස්ථාවේදී පුත්තලම වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා ඇතුළු නිලධාරීන් ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කළ අතර, ඒ අනුව, මෙම උස්සාන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා 2021.08.26. හා 2021.10.01 දිනැති ලිපි මඟින් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා දෙන ලදී. එහිදී ඉබ්බන්වලයාය ව්‍යාපෘතිය සඳහා දිනකට 656 $m^3$ ක හා තම්මන ව්‍යාපෘතිය සඳහා දිනකට 60$m^3$ ක ජල ප්‍රමාණයක් ලබා ගැනීම සඳහා අනුමැතිය ලබා දී ඇත. එමෙන්ම, විලත්තව මංකඩෙහි ඉදි කර ඇති බැම්ම හේතුවෙන් තම්මන උස්සාන වාරි ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන ස්ථානයට සහ සෙංගල් ඔය බැම්ම හේතුවෙන් ඉබ්බන්වලයාය උස්සාන වාරි ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන ස්ථානයට අගෝස්තු සැප්තැම්බර් මාසයන්හිදීත්, ජලය හිඟතාවයක් මෙතෙක් ඇති වී නොමැත. | ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර ව්‍යාපෘති ආරම්භ කළයුතු අතර ඇස්තමේන්තු මුදල ඉක්මවා වියදම් නොකල යුතුය. |

2.8 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

--------------------------------

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ දී ආසන්නයේ පිහිටා ඇති අධි බලැති විදුලි රැහැන් පවතී නම් තිරස් හා සිරස් දුරස්ථතාවය (Horizontal & Vertical Distance) හා එමගින් ශාරිරික ව ඇතිවිය හැකි චුම්භක (Magnetic Impact) බලපෑම සැලකිල්ලට ගෙන කටයුතු කළයුතු වුවද, ඒ පිළිබඳව සැළකිල්ලක් නොදක්වා මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකරමින් පවතින බව නිරීක්ෂණය විය. බිත්තියේ සිට අඩි 2.5 ක් ආසන්නයේ ඇති මෙම විදුලි රැහැන් ඉවත් කර දෙන ලෙස ගොඩනැගිල්ලේ 03 වන අදියර ඉදිකරන අවස්ථාවේ දී විදුලි බල මණ්ඩලයෙන් ඉල්ලා ඇති අතර, ඒ සඳහා රු.4,023,389 ක් ගෙවිය යුතු බව දන්වා තිබුණි. | දිස්ත්‍රික් විදුලි ඉංජිනේරු විසින් ස්ථානීය පරීක්ෂණයක් සිදුකර විදුලි රැහැන් තුළින් අවදානමක් නැති බවට ප්‍රකාශ කර ඇත. ලිඛිත නිශ්කාෂණ ලබා දෙන බවට පවසා ඇත. | අදාල නිර්දේශ ලබාගත යුත්තේ ශක්‍යතා අධ්‍යයන අවස්ථාවේ දී වන අතර, ලබාදෙනු ලැබූ නිර්දේශ පිළිගත් ප්‍රමිතීන්ට අනුකූල ද යන්න සළකා ඉදිරි ක්‍රියාමාර්ග ගතයුතුය. |

2.9 හඳුනාගත් අලාභ

-----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| (අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ මඟපෙන්වීම අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල සංවර්ධන වැඩ විෂයයන් සඳහා බොරළු කියුබ් ඒකක ස්ථානීය මිල (පැටවීම හා රාජ්‍ය භාග්‍යා ඇතුළත්ව) රු.3,000 ක් වන පළාත් මිල කමිටුවේ ස්ථානීය මිල භාවිතා කර තිබුණු ද , පුත්තලම් දිස්ත්‍රික් ලේකම්ගේ අංක DSP/TFC/CS/01/ මි.ක/(1)/2021 හා 2021 ජනවාරි 01 දිනැති දිස්ත්‍රික් මිල කමිටු වාර්තාව අනුව බොරළු කියුබ් එකක් පැටවීම හා රාජ්‍ය | පරීක්ෂා කර බලා වැඩිපුර ගෙවීම අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගන්නා බව දන්වමි. | සත්‍ය මිල රේටයන් භාවිතා කර ව්‍යාපෘති ඇස්තමේන්තු පිළියෙල කළයුතු අතර, වැඩිපුර ගෙවීම් වගකිවයුතු නිලධාරීන්ගෙන් ආපසු අයකල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | භාගය ඇතුළත්ව ස්ථානීය මිල රු.2,000 ක් බව දක්වා තිබුණි. ඒ අනුව 2021 වර්ෂයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ක් ව්‍යාපෘති 89 ක් සඳහා භාවිතා කරන ලද බොරළු ඝන මීටර් 7482.8 ක් හෙවත් කියුබ් 2641.3 ක් භාවිතා කිරීමේ දී කියුබ් එකකින් රු.1,000 ක් බැගින් රු.2,641,300 ක අලාභයක් සිදුවී තිබුණි. | | |
| (ආ) | සුළු හා මධ්‍ය පරිමාන හාල්මොල් හිමියන් මගින් වී මිලදී ගෙන එම වී ප්‍රමාණයට මුදල් රජයෙන් ගෙවා තිබුණ ද, 2020/2021 මහ කන්නය සඳහා සහල් මෝල් හිමියන් 11 ක්ම දෙසැම්බර් ලබාදිය යුතු නාඩු සහල් කිලෝ ග්‍රෑම් 402,927.7ක් හෙවත් ලබාදිය යුතු සහල් ප්‍රමාණයෙන් සියයට 61.12 ක් ද, 2021 යල කන්නය සඳහා රජයෙන් මුදල් ගෙවා මිලදී ගත් වී සඳහා සහල් ලබාදිය යුතු වීමෝල් හිමියන් 19 දෙනාටම අදාලව ලබාදිය යුතු නාඩු සහල් කිලෝග්‍රෑම් 1,006,687.5ක් හෙවත් ලබාදිය යුතු මුළු සහල් ප්‍රමාණයම 2022 මැයි 24 දිනවන විට ද, ලබාදී නොතිබුණ ද, ඒ සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | සහල් ලබා ගැනීමට හෝ අවශ්‍ය නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | කාර්යක්ෂමව අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ඇ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නව ගොඩනැඟිල්ල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව අවලංගු කර බේරුම්කරණයකට යාම මත බේරුම්කරන කටයුතු සඳහා උපදේශන හා සාමාජික ගාස්තු ලෙස රු.1,464,500ක් ගෙවීමට සිදුවී තිබුණි. | 14 වන බිල්පත නොගෙවීම නිසා ගිවිසුම් ප්‍රකාරව විනිශ්චය මණ්ඩලයට බේරුම් කරණයට යොමු කරන ලදී. එහි තීරණයට කොන්ත්‍රාත් පාර්ශවය එකඟ නොවූ බැවින් බේරුම්කරණයට යොමු වන ලදී. ඒ අනුව අදාල ගාස්තු ගෙවීම් කර ඇත. | 14 වන බිල්පත නොගෙවීමෙන් බේරුම්කරණයට අදාල වියදම් සිදුවී ඇති බැවින්, එම මුදල් අයකර ගැනීමට කටයුතු කළයුතුය. |

**3. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සිය විෂයපථයට අදාලව තිරසාර සංවර්ධන අරමුණු හා අරමුණු සම්බන්ධයෙන් වන ඉලක්ක පාදක දත්ත සහ ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක හා තිරසාර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනයේ කාර්යභාරය හා සම්බන්ධ උනන්දුවක් දක්වන පාර්ශවයන් හඳුනාගෙන නොතිබුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් හඳුනාගත් තිරසාර සංවර්ධන ඉලක්ක ක්ෂේත්‍ර නිලධාරීන්ට ලබා දී ඉලක්ක සපුරා ගැනීම සම්බන්ධව අධීක්ෂණය සිදු කරයි. | තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්කවලට අනුකූල වන ආකාරයට කටයුතු කළයුතුය. |
| (ආ) දේශීය ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ජාතික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වන තත්ත්වයකදී ප්ලාස්ටික් භාවිතය අවම කිරීම සඳහා රාජ්‍ය ආයතන දිරිමත් වියයුතුව ඇති බව නිරීක්ෂණය වුවද, විමධ්‍යගත වැඩසටහන යටතේ ස්වේච්ඡා සංවිධාන වෙත ලබාදීම වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 ම ප්ලාස්ටික් පුටු 9218 මිලදී ගැනීම වෙනුවෙන් රු.10,621,677 ක මුදලක් ද, ප්ලාස්ටික් මේස 10 ක් මිලදී ගැනීම වෙනුවෙන් රු.56,400 ක මුදලක් ද, වශයෙන් එකතුව රු.10,973,577 ක් වටිනා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය මිලදී ගෙන තිබුණු අතර, පුත්තලම දිස්ත්‍රික්කය පුරාම ක්‍රියාත්මක වී තිබුණු එම මිලදී ගැනීම් හේතුවෙන් එම ප්ලාස්ටික් තොගයන් ඉදිරි වර්ෂවලදී පරිසරයට එක්වීමේ අවදානම ඇති බව විගණනයට නිරීක්ෂණය විය. | ප්ලාස්ටික් භාවිතය අවම කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව දිස්ත්‍රික් දේශපාලන අධිකාරිය දැනුවත් කර ඇති අතර වැඩි පිරිසකට ප්‍රතිලාභ ලබා දීමේ අරමුණින් හා ප්‍රජාවගේ අවශ්‍යතාවන් සලකා ප්ලාස්ටික් පුටු ලබා දීම සිදු කරයි. ප්ලාස්ටික් වතුර ටැංකි සඳහා විකල්ප ටැංකි නැති බව ද පෙන්වා දෙමි. | තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්කවලට අනුකූල වන ආකාරයට කටයුතු කළයුතුය. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අනුමත කාර්ය මණ්ඩලය තුළ තනතුරු 12 කට අදාලව සේවක පුරප්පාඩු 26 ක් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අනුමත කාර්ය මණ්ඩලය තුළ තනතුරු 18 කට අදාලව සේවක පුරප්පාඩු 326ක් පවතින බව නිරීක්ෂණය විය. | එකඟ වෙමි. | පවතින පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකල යුතුය. |